සියලුම හිමිකම් ඇවිරිණි.
*All Rights Reserved.*

## මධ්‍ය වාර පරීක්ෂණය 2015

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I

**11 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක **1 - 40** තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති **(1), (2), (3), (4)** පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

01. පරිගණකයක් යන්න වඩාත් නිවැරදිව අර්ථකථනය වන්නේ,

(1) පරිගණකය යනු සියළුම අවශ්‍යතා සපුරාගැනීමට බිහිවූ විද්‍යුත් උපකරණයකි.

(2) දත්ත ලබාගෙන තොරතුරු බවට පත්කරන උපකරණයකි.

(3) පරිගණකයට දත්ත ලබාගෙන ඒවා සැකසීම මගින් තොරතුරු ලෙස ලබාදෙන තොරතුරු ගබඩා කළ හැකි විද්‍යුත් උපකරණයකි.

(4) ඉහත කිසිවක් නොවේ.

02. පරිගණක පරම්පරා අනුව වර්ගීකරණයේදී භාවිතා කළ සැකසුම් තාක්ෂණ උපාංග අනුපිළිවෙල දැක්වෙන නිවැරදි පිළිවෙල වන්නේ,

(1) රික්තක නල, අනුකූලිත පරිපථ, ට්‍රාන්සිස්ටරය (2) ට්‍රාන්සිස්ටරය, රික්තක නල, අනුකූලිත පරිපථ

(3) ට්‍රාන්සිස්ටරය, අනුකූලිත පරිපථ, රික්තක නල (4) රික්තක නල, ට්‍රාන්සිස්ටරය, අනුකූලිත පරිපථ

03. පහත සඳහන් ඒවායින් තොරතුරක් වන්නේ,

(1) පන්තියක සිටින ගැහැණු හා පිරිමි ළමුන්ගේ නම්

(2) දුරකථන අංකයක අවසන් අංක හතර

(3) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) තොරතුරු තාක්ෂණ විෂයේ සමත් සිසුන් ගණන දක්වන ප්‍රස්ථාර සටහන

(4) සිසුන්ගේ ඇතුළත්වීමේ අංක

04. ALT, CTRL, DEL ............. යනු යතුරු පරිගණකයක යතුරු පුවරුවක ඇති යතුරු කිහිපයක් වේ. ඒවා හඳුන්වන්නේ,

(1) පාලන යතුරු (Control Keys) (2) අක්ෂර යතුරු (Typing keys) (3) සංඛ්‍යා යතුරු (Numeric keys) (4) විශේෂ යතුරු (Special keys)

05. දැක්වීමේ උපක්‍රම (Pointing Devices) පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) මූසිකය, ආලෝක පෑන, ස්පර්ශක සංවේදී තිරය, වෙබ් කැමරාව

(2) ආලෝක පෑන, සුපරීක්ෂණය, මූසිකය, මෙහෙයුම් යටිය.

(3) ඩිජිටල් කැමරාව, මූසිකය, ආලෝක පෑන, වෙබ් කැමරාව

(4) ස්පර්ශක සංවේදී තිරය, මූසිකය, ආලෝක පෑන, මෙහෙයුම් යටිය.

06. පහත දැක්වෙන ප්‍රකාශයන් සලකා බලන්න.

A - සසම්භාවී පිවිසුම් මතකය (RAM) ඉක්මනින් නෂ්‍යවන මතකයකි.

B - ඉතාමත් ඉක්මනින් දත්ත ප්‍රවේශයක් සිදුවන (Data Access Speed) ඇත්තේ රෙජිස්තර මතකයටයි.

C - සංගත තැටියක මතක ධාරිතාවයට වඩා (CD) වැඩි මතක ධාරිතාවයක් සුනම්‍ය තැටිය (floppy Disk) සතුව ඇත.

මෙම ප්‍රකාශ අතරින්,

(1) A පමණක් සත්‍ය වේ. (2) A හා B පමණක් සත්‍ය වේ.

(3) C පමණක් සත්‍ය වේ. (4) ඉහත සියල්ලම සත්‍ය වේ.

07. යම්කිසි සංඛ්‍යා පද්ධතියක පාද අගය n නම් එම සංඛ්‍යා පද්ධතියෙන් නිරූපණය වන විශාලතම සංඛ්‍යාංක (Digit) වන්නේ,

(1) 2 * n (2) 16 * n (3) n + 1 (4) n - 1

08. $A = 45_{10}$ $B = 111000_2$ $C = 37_8$ $D = 1A_{16}$ යන සංඛ්‍යාවලින් කුඩාම සංඛ්‍යාව කුමක්ද?

(1) A (2) B (3) C (4) D

09. $P = 1110_2$ හා $Q = 1111_2$ නම් P + Q වල අගය වන්නේ,

(1) $10010_2$ (2) $11001_2$ (3) $11101_2$ (4) $11100_2$

10. ගුරුවරයෙකු ICT විෂය අංකය 80 ලෙස පරිගණකයට යතුරු පුවරුව මගින් ආදානය කරයි. පරිගණකයේ සසම්භාවී පිවිසුම් මතකයේ (RAM) මෙම සංඛ්‍යාව ද්විමය ආකාරයෙන් ගබඩා වේ. RAM හි ගබඩා වෙන ද්විමය අංකය වන්නේ,

(1) $101000_2$ (2) $1010000_2$ (3) $1010100_2$ (4) $100001_2$

11. රවිඳු ළඟ 2850 KB ප්‍රමාණයේ ඡායාරූප එකතුවක් තිබේ. මෙය ආචය කිරීම (Store) සඳහා භාවිතා කළ හැකි සුවහනීය සැනෙලි මතකයේ (Potable flash Drive) අවම මතක ධාරිතාවය කොපමණද?

(1) 1 MB (2) 1 GB (3) 3 MB (4) 2 GB

12. ASCII කේත ක්‍රමයට අනුව $1000111_2$ මගින් G නිරූපණය කරයි නම් $1000100_2$ සංඛ්‍යාවෙන් නිරූපණය කරන්නේ,

(1) H (2) D (3) F (4) E

13. පහත සඳහන් සත්‍යතා වගුව අධ්‍යනයෙන් X ප්‍රතිධානයට අදාළ වන තාර්කික ද්වාරය තෝරන්න.

| A | B | X |
|---|---|---|
| 0 | 0 | 1 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 0 |




14. වෙළඳ සමාගමක් අළුත් භාණ්ඩ ප්‍රචාරණ වැඩසටහනකදී භාණ්ඩ අයිතම තුනක් සහිත ඇසුරුමක් රු. 500/- අලෙවි කරයි. ඇසුරුමේ හාල් 1 kg (A) හා සීනි 1 kg (B) අඩංගු වේ. පාරිභෝගිකයාට තුන්වෙනි අයිතමය ලෙස කිරිපිටි 400 g පැකට්ටුවක් (C) හෝ පරිප්පු 1 kg (D) ලෙස තෝරාගත හැකිය. ඉහත සංසිද්ධිය නිරූපණයට අදාළවනු බූලිය ප්‍රකාශය වන්නේ,

(1) (A AND B) AND C AND D (2) A AND B AND (C OR D)
(3) A AND B OR (C OR D) (4) A OR B OR (C AND D)

15. මෙහෙයුම් පද්ධතියක් (Operating System) මගින්,

A - පරිගණකයේ ගබඩාකරන ලද ලිපිගොනු වලට අදාළව පරිගණක මතකය කළමණාකරණයක් කරයි.

B - පරිශීලකයාට පරිගණකය භාවිතයට අදාළ උපදෙස් හා ලබාදිය යුතු විධානයන් ලබාදීමට මඟපෙන්වීම

C - අතුරු මුහුණතක් (Interface) සපයමින් පරිශීලකයා හා පරිගණක දෘඩාංග අතර අන්තර් සම්බන්ධතාවය ගොඩනගයි.

මෙම ප්‍රකාශ අතරින් වඩාත්ම නිවැරදි වන්නේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ලම

- **ප්‍රශ්න අංක 16 හා 17 යන ප්‍රශ්න සඳහා විද්‍යුත් පැතුරුම්පත් මෘදුකාංගයෙන් සකසන ලද පැතුරුම්පත් උපයෝගී කරගන්න.**

| | A | B | C |
|---|---|---|---|
| 1 | Name | IT | MATHS |
| 2 | Kamal | 80 | 75 |
| 3 | Nimal | 50 | 80 |
| 4 | Pamal | 60 | 80 |
| 5 | Ruwan | 75 | 70 |
| 6 | Nuwan | 90 | 93 |
| 7 | No. of Stude. | | |

16. මෙම පැතුරුම්පතේ B 7 කෝෂයේ = COUNT (B2 : B6) ලෙස සූත්‍රය දැක්වීමෙන් B7 කෝෂයේ ප්‍රදර්ශනය වන අගය වන්නේ,

(1) 315 (2) 90
(3) 05 (4) 04

17. ගණිතය ලකුණුවල උපරිම ලකුණු ලබාගැනීම සඳහා C8 කෝෂයට ඇතුළත් කළයුතු වන සූත්‍රය,

(1) = Total (C2 : C6) (2) = Average (C2 : C6)

(3) =Max (C2 : C6)  (4) =Mini (C2 : C6)

18. වදන් සැකසුම් මෘදුකාංගයක් වන Microsoft word 2007 මෘදුකාංගයකින් අයවැය ලේඛනයෙක් සකස්කරන පරිශීලකයකුට MS - word පිටුව තුළ සිටම එම ගණිතමය කටයුතු කළහැකි පහසුම ආකාරය වන්නේ,

(1) Microsoft excel විවෘත කර වගුව සකසා Copy Paste කිරීම.

(2) Microsoft Word - insert හි ඇති Object තුළින් Excel ලබා ගැනිම.

(3) Excel තිරයේ සකසාගෙන PDF file එකක් ලෙස සුරක්ෂිත කිරීම.

(4) Open calculater සහ ගණනය කිරීම.

19. කදාවක (Slide) ඇති අනුරූපයක් (Image) සීරවෙන් වමේ සිට දකුණට චලනය කිරීම සඳහා විද්‍යුත් සමර්පන (Presentation) මෘදුකාංග තුළ ඇති කුමන පහසුකම යොදාගනීද?

(1) කදා පිරික්සුම (Slide layout)  (2) කදා සංක්‍රාන්තිය (Slide transition)

(3) සජීවනය (Animation)  (4) කදා සැලැස්ම (Slide Design)

20. විද්‍යුත් පැතුරුම් පතක් සුරක්ෂිත කිරීමේදී ලබාදෙන ලිපිගොනු දිගුව (file extention) වන්නේ,

(1) .Text  (2) .xlsx  (3) . ppt  (4) .Doc

21. 

| ප රිගණක භාවිතය අද සමාජයේ ඉතා බහුලය. |
|---|

මෙම ලේඛනය තුළ ඇති මූලික වදන් හැඩගැස්වීම වන්නේ,

(1) Bolt and Alignment  (2)Drop Cap

(3) Insert word Art  (4) Grow font භාවිතය

22. දත්ත සමුදායක (Data Base) වගුවක ප්‍රාථමික යතුරු (Primary key) භාවිතා කල හැකි ක්ෂේත්‍ර නාමයක් (field name) වන්නේ,

(1) උපන්දිනය  (2) ලිපිනය  (3) නම  (4) හැඳුනුම්පත් අංකය

23. හුඳුනුම්පත් අංකය (ID Num) ක්ෂේත්‍ර නාමය සැකසීමේදී වඩාත් උචිත දත්ත වර්ගය (Data Type) වන්නේ,

(1) Numbers  (2) Text  (3) Date and Time  (4) Currency

24. දත්ත සමූහයක (Data base) ප්‍රධාන ක්ෂේත්‍රයන් සමූහයක් ........................ වේ.

(1) රෙකෝඩයක් (Record)  (2) පිරිසැලැස්ම (Layout)

(3) ලිපි ගොනුවක් (File)  (4) clip board වේ.

25. Assembly භාෂාව අදාළ වන්නේ කුමන පරිගණක භාෂා පරම්පරාවටද?

(1) පළමු පරම්පරාවට  (2) දෙවන පරම්පරාවට

(3) තුන්වන පරම්පරාවට  (4) සිව්වන පරම්පරාවට

26. වගන්තියෙන් වගන්තිය යන්ත්‍ර භාෂාව (machine code) බවට පරිවර්ථනය කරන්නේ,

(1) Translator මගිනි.  (2) Interpreter මගිනි.

(3) Compiler මගිනි.  (4) Assembler මගිනි.

- **ප්‍රශ්න අංක 27 හා 28 සඳහා පිළිතුරු ලබාදීමේදී පහත ගැලීම් සටහන උපයෝගී කරගන්න.**




27. ඉහත ගැලීම් සටහනේ ප්‍රතිදානය වන්නේ,

(1) 50, 45, 40, 35, 30, 25, 20, 15, 10  (2) 50, 55, 60, 65, 70, 75, 80, 85, 90

(3) 05, 10, 15, 20, 25, 30, 35, 40, 45 (4) 55, 45, 35, 25, 15, 05

28. ඉහත ගැලීම් සටහනේ "E" හි Num = Num - 10 ලෙස වෙනස් කළේනම් ලැබෙන ප්‍රතිදානය වන්නේ,

(1) 50, 40, 30, 20, 10 (2) 40, 30, 20, 10, 0

(3) 10, 20, 30, 40, 50 (4) -10, -20, -30, -40, -50

29. ඉහල මට්ටමේ පරිගණක භාෂාවක් නොවන්නේ,

(1) VB (2) JAVA

(3) Machine language (4) C++

30. ක්‍රම ලේඛනයක භාවිතාවන IF.........., Else වගන්තිය ............... පලාන ව්‍යුයහ සඳහා උදාහරණයකි.

(1) ලූප (loop) (2) පුනරාවර්තන (Repertition)

(3) තේරීම් (Selection) (4) අනුක්‍රමික (Sequence)

31. ලෝකයේ භාවිතාවන භාෂාවන් බොහොමයකින් පරිගණකය හැසිරවීමේ පහසුකම දැන් උදාවී ඇත. මේ සඳහා මූලික වන්නේ,

(1) අන්තර් ජාල භාවිතය (2) Unicode හඳුන්වාදීම

(3) නවීන පරිගණක හඳුන්වාදීම (4) භාවිත මෘදුකාංග භාවිතය

32. භූ ගෝලීය වශයෙන් කුඩා ප්‍රදේශයක ව්‍යාප්තව ඇති පරිගණක ජාලයක් හඳුන්වන්නේ,

(1) ස්ථානීය ප්‍රදේශ ජාලය (LAN) (2) පුරවර ප්‍රදේශ ජාල (MAN)

(3) පුළුල් ප්‍රදේශ ජාල (WAN) (4) අන්තඃජාලය

33. තත්කාලීන සැකසුම් සිදුකරන (Online real time processing) පද්ධතියක් වන්නේ,

(1) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය (ATM) (2) දුරකථන බිල්පත්

(3) වැටුප් ලේඛන සැකසීම (4) විභාග ප්‍රතිඵල සැකසීම.

34. ඉහල කළමනාකරණයේ තීරණ ගැනීමට අනුග්‍රහය දක්වන තොරතුරු පද්ධතිය වන්නේ,

(1) විධායක තොරතුරු පද්ධතිය Executive information system

(2) තීරණ ආධාරක තොරතුරු පද්ධති

(3) කළමනාකරණ තොරතුරු පද්ධති

(4) ගණුදෙනු සැකසුම් තොරතුරු පද්ධති

35. හිස (Head) හා තුඩු (pins) සහිත මුද්‍රණ යන්ත්‍රයක් වන්නේ,

(1) තිත්න්‍යාස මුද්‍රණ යන්ත්‍රය (2) තීන්ත විහිදුම් මුද්‍රණ යන්ත්‍රය

(3) ලේසර් මුද්‍රණ යන්ත්‍රය (4) තාප සංවේදී මුද්‍රණ යන්ත්‍රය

36. පහත සඳහන් ඒවායින් පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ (SDLC) පියවරක් නොවන්නේ,

(1) පද්ධති සැකසුම් (System Design) (2) පද්ධති විශ්ලේෂණය (System Analysis)

(3) පද්ධති වර්ගීකරණය (System Classification) (4) පද්ධති නඩත්තුව (System Maintenance)

37. 'පාසල පද්ධතියකි' එහි උපපද්ධතියක් ලෙස දැක්විය නොහැක්කේ,

(1) ආචාර්ය මණ්ඩලය (2) ගණිත අංශය (3) රථගාල (4) පුස්තකාලය

38. A = # B = @ C = &

ඊ මේල් (E-mail) ලිපිනයක් තුළ වලංගු සංකේතය හෝ සංකේතයන් වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A හා B පමණි.

39. 10 mod 3 = ? වන අගය වන්නේ,

(1) 02 (2) 3.3 (3) 1 (4) 13

40. මධ්‍ය සැකසුම් ඒකකය සැදී ඇත්තේ,

(ල. 1 x 40 = 40)

e-thaksalawa National e-Learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
*All Rights Reserved.*

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය II

**11 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකය: |
|---|

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට (5) පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක්ද, අනෙකුත් ප්‍රශ්නවලට ලකුණු 10 බැගින්ද හිමි වේ.**

01. (1) නිර්මාණ තාක්ෂණය අනුව පරිගණක වර්ගීකරණය කරන්න.

(2) දත්ත සමුදායන් කළමනාකරණයේදී විවිධ උපාංග (objects) භාවිතා කළ හැක. එසේ භාවිතා කළ හැකි උපාංගයන් 02 ක් නම් කරන්න.

(3) පහත දී ඇති A වගුවේ හා B වගුවේ එකිනෙකට ගැලපෙන අයිතම අතර ඊතල අඳින්න.

| A | B |
|---|---|
| පරිගණක ජාල වර්ගයකි. | BCD |
| නියමු මාධ්‍යයකි. | PS2 |
| අර්ධ ද්විපථ දත්ත සන්නිවේදනය | WAN |
| පරිගණක කේත ක්‍රමය | UTP |
| යතුරු පුවරුව, මූසිකය සම්බන්ධ කරයි. | Walkie-talkie |

(4) පහත දී ඇති තාර්කික පරිපථය (Logic circuit) නිරූපණයට අදාළ බූලීය ප්‍රකාශනයක් ලියන්න. එය නිර්මාණයට යොදාගත් තාර්කික ද්වාරයන් වෙන වෙනම දක්වන්න.




(5) $7F_{16}$ යන සංඛ්‍යාව අෂ්ටමය සංඛ්‍යාවක් බවට පරිවර්තනය කරන්න.

(6) A හා B යන හිස්තැන් සඳහා වරහන් තුළ පහත සඳහන් පිළිතරුවලින් පිළිතුරු තෝරා ලියන්න.

(Windows, Joseph Jacquard, DOS, චාල්ස් බැබේජ්, ඇඩා ඔගස්ටා)

★ සිදුරුපත් ක්‍රමය මුලින්ම සොයාගනු ලැබුවේ ...........Ⓐ........... විසිනි.

★ විධාන රේඛා අතුරු මුහුණතක් (CLI) ඇත්තේ ...........Ⓑ........... හිය.

(7) ඇල්ගෝරිදමයක් යනු කුමක්ද? එය දැක්විය හැකි ආකාරයන් 02 ක් නම් කරන්න.

(8) බැංකුව නමැති තොරතුරු පද්ධතිය තුළ දැකිය හැකි පද්ධති කොටස් (උපපද්ධති, සංඝටක) වෙන වෙනම නම් කරන්න.

(9) විශ්ව ශ්‍රේණියක කෙවෙණිය (USB) සතු සුවිශේෂතා 02 ක් නම් කරන්න.

(10) අන්තඃජාලය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? (ලකුණු 2 x 10 = 20)

02. රනිල්ට තම නිවසේ PC පරිගණකයක් ඇත. එය භාවිතයෙන් ඔහු තම අධ්‍යාපන කටයුතු සාර්ථක කරගැනීමට උත්සහ දරයි. එසේම විදේශ රටක සිටින මිතුරකු සමඟ සබඳතාවයක් පවත්වාගෙන යෑමටද පරිගණකය ඔහුට බෙහෙවින් ප්‍රයෝජනවත් විය.

(1) පරිගණකය තම අධ්‍යාපනය සඳහයා යොදා ගත හැකි ආකාර දෙකක් නම් කරන්න.(ල. 02)

(2) පරිගණකයට අන්තර්ජාල පහසුකම් ලබාගැනීමට උපාකරීවන ප්‍රධාන දේවල් 03 නම් කරන්න.

(ල. 02)

(3) රනිල් තම විදේශගත මිතුරාට අන්තර්ජාලය හරහා තොරතුරු හුවමාරු කරන ආකාරයන් 03 ක් නම් කරන්න. (ල. 03)

(4) ව්‍යාපාර හා මුල්‍ය ආයතන කටයුතු සඳහා පරිගණකය භාවිතා කරගත හැකි අවස්ථාවන් 03 ක් ලියන්න. (ල. 03)

03. A හා B පහත සඳහන් තාර්කික ද්වාර (logic gate) පරිපථයේ ආදානයන් වන අතර X යනු එහි ප්‍රතිදානයයි.




(1) X සඳහා වන විජීය ප්‍රකාශනය ලියන්න. (ල. 02)

(2) එම ප්‍රකාශනයට අදාළ සත්‍යතා වගුව අඳින්න. (ල. 02)

(3) සුළු කරන්න.

1. $100111_2 + 11111_2$ (ල. 02)

2. $100101_2 - 1001_2$ (ල. 02)

(4) $3D_{16}$ යන්න දශමය සංඛ්‍යාවක් සේ ලියන්න. (ල. 02)

the National e-learning Portal for The General Education

04. ඉතා සුළුවෙන් ආරම්භ කළ R. V. K. රෙදිපිළි වෙළඳ ව්‍යාපාරය අද වනවිට තරමක් දියුණු මට්ටමක පවතී. සේවකයන්ගේ විස්තර, වැටුප් වාර්තා, භාණ්ඩ මිලදී ගැනීම්, ගබඩා කිරීම්, විකිණීම් ආදී මුල්‍යමය ගනුදෙනු ගිණුම් කටයුතු යනාදිය සේවකයකු (ලිපිකරුවකු) විසින් අතින් ලේඛන වශයෙන් පවත්වාගෙන ආ නමුත් දැන් එම කාර්යයන් පරිගණක පද්ධතියක් මගින් සිදුකිරීමට අපේක්ෂා කරයි. මෙමගින් ගනුදෙනුකරුවන්ට, සැපයුම්කරුවන්ට, අයිතිකරුවන් හා බැංකු වැනි ආයතන සඳහා කාර්යක්ෂම සේවාවක් ලබාදීමට පිටුවහලක් වේ යැයි අයිතිකරු අපේක්ෂා කරයි.

(1) a. හස්තමය තොරතුරු පද්ධතියක අවාසි 02 ක් සඳහන් කරන්න. (ල. 01)

b. පරිගණකගත තොරතුරු පද්ධතිය ප්‍රධාන සංඝටක 04 ක් සඳහන් කරන්න. (ල. 02)

(2) ඉහත ව්‍යාපාරයට අදාළ තොරතුරු පද්ධතියේ පද්ධති සීමාව, උප පද්ධති, සංඝටක, බාහිර පරිසරය යනාදිය ඇඳ නම් කරන්න. (ල. 02)

(3) මෙම ව්‍යාපාරය පරිගණක පද්ධතියක් ලෙස ක්‍රියාත්මක කරන්නේ නම් භාවිතයට ගත හැකි මෘදුකාංග 02 නම් කරන්න. (ල. 02)

(4) දත්ත පාදක කළමනාකරණයේදී සේවකයන් පිළිබඳ විස්තර වගුවක සටහන් කරන්නේ යැයි සිතා,

a. වගුවට ඇතුළත් කරන ක්ෂේත්‍ර නාම (field names) 04 ක් නම්කරන්න. (ල. 02)

b. ප්‍රාථමික යතුර (primary key) යෙදීම සඳහා සුදුසු ක්ෂේත්‍රයක් නම්කරන්න. (ල. 01)

05. පහත දැක්වෙන වැඩපතෙහි එක්තරා ආයතනයක සේවය කරන සේවකයන්ගේ තොරතුරු දැක්වේ. මෙම වැඩපත ආධාරයෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | A | B | C | D | E | F |
|---|---|---|---|---|---|---|
| 1 | Name | No. of items sold | Commission for an item | Basic Salary | Commission | Gross salary |
| 2 | Kasun | 10 | 15 | 3500 | | |
| 3 | Nuwan | 12 | | 3200 | | |
| 4 | Sujith | 17 | | 4000 | | |
| 5 | Amal | 11 | | 3500 | | |
| 6 | Ranil | 09 | | 3800 | | |

(1) කසුන්ගේ කොමිස් මුදල E2 කෝෂයට ලබාගැනිම සඳහා අදාළ සූත්‍රය ලියන්න. (ල. 02)

(2) එක් එක් සේවකයාගේ කොමිස් මුදල අදාළ කෝෂ වලට ලබාගැනීම සඳහා ගතහැකි පියවර ලියා දක්වන්න. (ල. 02)

(3) කසුන්ගේ ශුද්ධ වැටුප F2 කෝෂයට ලබාගැනීම සඳහා අදාළ සූත්‍රය ලියන්න. (ල. 02)

(4) එක් එක් සේවකයාගේ ශුද්ධ වැටුප අදාළ කෝෂ වලට ලබාගැනීම සඳහා ගතහැකි පියවර ලියා දක්වන්න. (ල. 02)

(5) එක් එක් සේවකයාගේ ශුද්ධ වැටුප් ලෙස ගෙවිය යුතු මුළු මුදල F7 කෝෂයට ලබාගැනීමට අදාළ සූත්‍රය ලියන්න. (ල. 02)

06. උෂ්ණත්වය වෙනස්වීම අනුව ජලයේ සිදුවන අවස්ථා විපර්යාසය පහත වගුවේ දැක්වේ. උෂ්ණත්වය ආදානය (Input) කළවිට,

| උෂ්ණත්වය (සෙල්සියස්) | ජලය පවතින අවස්ථා |
|---|---|
| 0° ට සමාන හෝ අඩු | අයිස් |
| 27° අඩු සහ 0° ට වැඩි | සිසිල් ජලය |
| 100° අඩු සහ 26° ට වැඩි | උණු ජලය |
| 100° හෝ ඊට වැඩි | හුමාලය |

(1) අවස්ථාව මුද්‍රණය කරන ආකාරය දැක්වීම සඳහා සුදුසු ගැලීම් සටහන අඳින්න. (ල. 05)

(2) එම ගැලීම් සටහනට අදාළ ව්‍යාජ කේතය ලියන්න. (ල. 05)

07. පහත සඳහන් මාතෘකා අතරින් 04 ක් සඳහා කෙටි සටහන් ලියන්න.

a. පද්ධති සංවර්ධන ජීවන චක්‍රය
b. e- government සංකල්පය
c. පරිගණක ක්‍රීඩාවල අවාසි
d. දත්ත සම්ප්‍රේෂණ මාධ්‍ය
e. පරිගණක ජාලකරණයේ වාසි
f. පරගණක මතකය (ල. 2.5 x 4 =10)